අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சாத்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு
COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION
තැ. පෙ. 1431, 36, මලලසේකර මාවත, කොළඹ 7. ● த.பெ.1431, 36, மலலசேகர மாவத்தை, கொழும்பு 7.● P. O. Box 1431, 36, Malalasekera Mawatha, Colombo 7.
දුරකථන අංක / தொலைபேசி / Telephone: 2559923, 2596360 ෆැක්ස් /பெக்ஸ் / Fax: 2596014


මගේ අංකය බීසී/1133/2016
2025/04/25

රනිල් වික්‍රමසිංහ මහතා,
අංක 11,
මල්පාර, කොළඹ 07.

**2023 අංක 09 දරණ දූෂණ විරෝධී පනත ප්‍රකාරව සිදුකරනු ලබන විමර්ශනයට අදාලව එම පනතේ 49(1) වගන්තිය ප්‍රකාරව කරනු ලබන අවසාන දැන්වීමයි**

මීන් පෙර ඔබ වෙත එවන ලද 2025.04.11 සහ 2025.04.21 දිනැති දැන්වීම්වලට වැඩිමනක් ලෙස වේ.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් අත් අඩංගුවට ගෙන අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද සැකකරුවකු සම්බන්ධයෙන් අනවශ්‍ය ලෙස මැදිහත්වී ඔබ විසින් මාධ්‍ය වෙත ප්‍රකාශයක් සිදුකරන ලදි. එම ප්‍රකාශයේ අඩංගු කරුණු පැහැදිලි කර ගැනීම සඳහා අවස්ථා දෙකකදී අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටින ලෙසට මීන්පෙර ඔබ වෙත දන්වා ඇත.

2025.04.25 දින අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටින ලෙසට ඔබ වෙත දන්වා ඇති දැන්වීමට පිළිතුරු වශයෙන් ඔබ වෙනුවෙන් නීතිඥ රේෂාන් ගමගේ මහතා විසින් එවන ලද ලිපියේ කරුණු සළකා බලා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් ඔබ හට මෙම කොමිෂන් සභාව හමුවේ පෙනී සිටීමට, ඔබ විසින් ඉල්ලා ඇති පරිදි 2025.04.28 දිනය ලබා දෙන ලෙසට මා වෙත දන්වා ඇත.

ඒ අනුව 2025/04/28 දින පැය 09.30 ට, කොළඹ 05, ජාවත්ත පාර, පැරණි හැඳුනුම්පත් දෙපාර්තමේන්තු ගොඩනැගිල්ලේ පිහිටි මෙම කොමිෂන් සභාවේ දූෂණ විමර්ශන අංශ iii හි පෙනී සිටීම සඳහා පැමිණෙන ලෙසට උක්ත පනතේ 49(1) වගන්තිය ප්‍රකාරව මෙයින් දන්වා සිටිමි.

මෙම දිනයේදී කිසිදු සාධාරණ හේතුවක් නොමැතිව කොමිෂන් සභාව ඉදිරියේ පෙනී නොසිටියහොත් ඔබට එරෙහිව 2023 අංක 09 දරණ දූෂණ විරෝධී පනතේ 126 වගන්තිය ප්‍රකාරව කටයුතු කරන බවට අවධාරණය කරමි.

**කොමිෂන් සභාවේ නියමය පරිදි,**

ආර්.එස්.ඒ. දිසානායක
අධ්‍යක්ෂ ජනරාල්